**විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 11 දරන විධානයන්

---

**විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සිදුකරන, තම මූලික ව්‍යාපාරය ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළඳුන් (මුදල් හුවමාරුකරන්නන්) වෙත නිකුත් කරනු ලබන විධානයන්**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) හා 6 වන වගන්ති ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම පහත සඳහන් නියමයන්ට යටත්ව පරිසීමිත වෙළඳුන් විසින් සිදු කළ යුතු ය.

**2. සාමාන්‍ය කොන්දේසි**

2.1 විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සඳහා නිරතවීමේ කාල පරාසය විශේෂයෙන් දක්වන ලද විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සෑම මුදල් හුවමාරුකරන්නෙක් සතුව ම පැවතිය යුතු ය.

2.2 තවද, මෙම විධානයන්ට අමතරව, සෑම මුදල් හුවමාරුකරන්නෙක්ම එම අවසර පත්‍රයේ සඳහන් නියමයන් සහ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

2.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිර්ණායක ප්‍රකාරව මුදල් හුවමාරු කිරීමේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂවරු, මූලික කොටස් හිමියන්, අවසන් අර්ථලාභී අයිතිකරුවන් සහ කළමනාකරණ තනතුරු දරන පුද්ගලයන් යථා යෝග්‍ය විය යුතු අතර අවසරපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී, අවසරපත්‍රය සමඟ අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඒ බව සනාථ කල යුතු ය.

2.4 අවසර පත්‍රය නිකුත් කරන අවස්ථාවේදී, සෑම මුදල් හුවමාරුකරන්නෙක්ම මුදල් හුවමාරු ව්‍යාපාරයේ නියුතු බලය පවරන ලද සේවකයන්ගේ තනතුරු සහ ආදර්ශ අත්සන් ඇතුළත් වූ වෙනම නම් ලැයිස්තුවක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය. පසුව සිදුවන ඕනෑම වෙනසක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත, එම වෙනස සිදු වී **රාජකාරි දින තුන(03)ක්** ඇතුළත දැනුම් දිය යුතු ය.

2.5 ඉහත 2.4 කොන්දේසිය යටතේ යම් බලයලත් ව්‍යාපාරික ස්ථානයක් සඳහා නම් සහ අනෙකුත් විස්තර සපයා ඇති පුද්ගලයකු/පුද්ගලයන් හැර වෙනත් කිසිදු පුද්ගලයෙකු එම බලයලත් ස්ථානයේ මුදල් හුවමාරු ව්‍යාපාරයේ නිරත නොවිය යුතු ය.

2.6 මුදල් හුවමාරුකරන්නන් විසින් මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා පමණක්ම පවත්වාගෙන යා යුතු බලයලත් ව්‍යාපාරික ස්ථානයන්හි අවසර පත්‍රයෙන් නියම කර ඇති ගනුදෙනුවල නිරත විය යුතු ය. මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයට අමතරව එම ස්ථානයේම වෙනත් ඕනෑම ව්‍යාපාරයක නිරතවීමට මුදල් හුවමාරුකරන්නන් අදහස් කරන්නේ නම්, එය විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු අතර, එවැනි ව්‍යාපාර මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙන් වෙන්ව පවත්වාගෙන යා යුතු ය.

2.7 ඕනෑම මුදල් හුවමාරුකරන්නෙකු විසින් නව ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීමට හෝ බලයලත් ව්‍යාපාරික ස්ථානයක් වෙනත් ස්ථානයකට ගෙන යාමට අදහස් කරන්නේ නම්, එවැනි වෙනසක් සිදුකිරීමට ප්‍රථම මුදල් හුවමාරුකරන්නන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ

අධ්‍යක්ෂ ගෙන්, පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය. තවද, ඕනෑම මුදල් හුවමාරුකරන්නෙකු විසින් බලයලත් ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට අදහස් කරන්නේ නම් හෝ, හිමිකම් ව්‍යුහය, අධ්‍යක්ෂවරුන් සහ කොටස් පැවරීම යනාදියෙහි යම් වෙනසක් සිදුවන්නේ නම්, එවැනි වෙනසක් සිදු කිරීමට ප්‍රථම මුදල් හුවමාරුකරන්නා විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

2.8 බලයලත් වෙළෙන්දෙකු සමඟ ඇති කර ගත් පූර්ව ගිවිසුම් මත ඔවුන් වෙත විකිණිය හැකි විදේශ ව්‍යවහාර මුදල් පමණක් මුදල් හුවමාරුකරන්නාගේ බලයලත් ව්‍යාපාරික ස්ථාන වලදී භාරගත යුතු අතර සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයක් සඳහාම එකී ගිවිසුම්වල අන්තර්ගත විදේශ ව්‍යවහාර මුදල් වර්ගවල ලැයිස්තු, වර්ෂය ආරම්භයේ දී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය. මෙම ලැයිස්තු කලින් කලට සංශෝධනය විය හැකි අතර, එවැනි සංශෝධන **රාජකාරි දින තුන(03)ක්** ඇතුළත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

2.9 මිලදීගන්නා ලද හෝ හුවමාරු කරන ලද විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් විකිණීමට සුදුසුකම් ඇති මුදල් හුවමාරුකරන්නන් සතුව ඇති විදේශ ව්‍යවහාර මුදල් විකිණීමෙන් පසු ශේෂය ලෙස පවතින විදේශ ව්‍යවහාර මුදල්, එම මිලදීගැනීමේ හෝ හුවමාරුකිරීමේ දින සිට **රාජකාරි දින පහ(05)ක්** ඇතුළත බලයලත් වෙළෙන්දකු සමඟ වෙනම පවත්වාගෙන යනු ලබන රුපියල් ගිණුමක තැන්පත් කළ යුතු ය.

2.10 මුදල් හුවමාරුකරන්නන් විසින් ගිණුමක් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දෙකු විසින් මුදල් හුවමාරුකරන්නන් වෙත ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය නොඉක්මවමින් ශ්‍රී ලංකා රුපියල් හෝ ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයක් සඳහා හුවමාරු කිරීමට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු භාරගත හැකි ය.

2.11 මුදල් හුවමාරුකරන්නා විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු භාරගැනීමට හෝ නිකුත් කිරීමට ප්‍රථම, එම මුදල් නෝට්ටුවල වලංගුභාවය, අදාළ රටෙහි මුදල් නිකුත් කිරීමේ අධිකාරිය මගින් අවලංගු කර නොමැති බව පරීක්ෂා කිරීමෙන් තහවුරු කර ගත යුතු ය.

2.12 විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලබා දී ඇති විශේෂාංගවලට අනුකූලව මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම සංවෘත පරිපථ රූපවාහිනී පද්ධතියක් (CCTV) ස්ථාපනය කළ යුතු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුව හට ඕනෑම අවස්ථාවකදී එම මුදල් හුවමාරුකරන්නන් සිදු කරන මුදල් හුවමාරු කිරීමේ ක්‍රියාකාරකම්, එමගින් මෙහෙයුම් කිරීමට හැකියාව පැවතිය යුතු ය.

2.13 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නම් කරනු ලැබූ නිලධාරීන් හට එතැන් විමර්ශන පැවැත්වීමට සෑම මුදල් හුවමාරුකරන්නෙකුම අවසර ලබා දිය යුතු ය.

**3. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා පමණක් අදාල අතිරේක විධානයන්;**

## විදේශ විනිමය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා මහ බැංකුව

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 11 දරන විධානයන්

---

3.1 විදේශයන්හි සංචාරය කිරීමේ අරමුණ සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට මුදල් හුවමාරුකරන්නන් සුදුසුකම් ලබනු ලැබේ.

3.2 එක් එක් බලයලත් ව්‍යාපාරික ස්ථානය මඟින් ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට එක් විදේශ සංචාරයක් සඳහා එක් ගනුදෙනුවකදී විකිණිය හැකි විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් 5000ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයකට නොවැඩි විය යුතු ය. යම් බලයලත් පුද්ගලයෙකු විසින් විදේශ සංචාරයක් සඳහා ඇ.එ.ජ.ඩොලර් 5000ට සමාන අගයකට දැනටමත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත්කර ඇත්නම් සහ එම ගනුදෙනුව දැනටමත් විදේශ ගමන් බලපත්‍රයේ පිටසන් කර ඇත්නම්, එම සංචාරය සඳහා නැවත විදේශ මුදල් නිකුත් කිරීම, මුදල් හුවමාරුකරන්නා විසින් නොකළ යුතු ය. එසේ වුවද, එම බලයලත් පුද්ගලයා විසින් ඇ.එ.ජ.ඩොලර් 5000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයකට අඩුවෙන් විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කර ඇත්නම්, නිසි උද්යෝගයකින් කටයුතු කිරීමෙන්, ඇ.එ.ජ.ඩොලර් 5000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා වූ ඉතිරි මුදල් ප්‍රමාණය, විදේශ ගමන් බලපත්‍රයේ නියමිත පිටසන් කිරීම සහිතව විකිණීමට මුදල් හුවමාරුකරන්නාට අවසර ලැබේ.

3.3 විදේශ සංචාරවල යෙදෙන්නන්ගේ ඉල්ලීම්වල සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමට අවශ්‍ය **ඇමුණුම (I)**හි දී ඇති වගුවෙන් දක්වා ඇති ලිපිලේඛන ලබා ගැනීමෙන් පසුව ඉහත 3.2හි දී ඇති සීමාවට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම, මුදල් හුවමාරුකරන්නන් ට සිදු කළ හැකි ය.

3.4 පුද්ගලයෙකුගේ නේවාසිකත්වය තීරණය කිරීම, විදේශ විනිමය පනතෙහි 31(3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විෂයභාර ඇමැතිවරයා විසින් නිකුත් කරන ලද නියෝගය ප්‍රකාරව සිදු කළ හැකි ය.

3.5 ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව සිදුකරන සියලුම විදේශ ව්‍යවහාර මුදල් විකිණීම් තරඟකාරී වෙළෙඳපොළ අනුපාතික යටතේ **ඇමුණුම (II)**හි දක්වා ඇති පරිදි "අංක 1 ආකෘති පත්‍රය" මඟින් කරන ලද අයදුම් කිරීම් සඳහා සිදු කළ යුතු ය.

3.6 සියලුම විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්, එම විදේශ ව්‍යවහාර මුදල් ඉල්ලුම් කරන පුද්ගලයාගේ විදේශ ගමන් බලපත්‍රයේ මෙම අරමුණ සඳහා වෙන්කර ඇති විශේෂිත පිටු වල රබර් මුද්‍රාව මත බලයලත් අත්සන සහිතව පිටසන් කළ යුතු ය.

### 4. වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවන්

4.1 සෑම ව්‍යාපාරික ස්ථානයකම විදේශ විනිමය ගනුදෙනු පවත්වා ගැනීම සඳහා සුදුසු මෙහෙයුම් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම මගින් සියලුම ගනුදෙනු ස්වයංක්‍රීයකරණය කළ යුතු ය.

4.2 ලදුපතක් නිකුත් කිරීමකින් තොරව සහ ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කිරීමකින් තොරව කිසිදු ගනුදෙනුවක්, සමාගම විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය. තවද, ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කරන ලද ගනුදෙනුවක් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ මකා දැමීම නොකළ යුතු ය. ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණවල විෂමතාවක්

ඇති බව ගනුදෙනුව නිවැරැදි බවට තහවුරු කිරීමෙන් පසු හඳුනාගතහොත්, සමාගම විසින් එම දෝෂය විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීමෙන් අනතුරුව එසැණින් නිවැරදි කළ යුතු ය.

4.3 එවැනි සියලු ගනුදෙනු පිළිබඳ වාර්තා ගබඩා කිරීම සඳහා උපස්ථ විධිවිධානයන් (back-up arrangement) ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු සලසා ගත යුතුය.

4.4 **ලදුපත්**

i. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කරන අවස්ථාවේ දී මුදල් හුවමාරුකරන්නන් විසින් ලදුපතක් නිකුත් කළ යුතු ය.

ii. ලදුපත් මුද්‍රණය කිරීම

අනුක්‍රමික අංක අනුපිළිවෙලට ස්වයංක්‍රීය පද්ධතියක් තුලින් ලදුපත් මුද්‍රණය කළ යුතු අතර, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී සියලුම ගනුදෙනුකරුවන් වෙත නිකුත් කළ යුතු ය. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ලදුපතෙහි ඉතා පැහැදිලිව දැක්විය යුතු ය.

iii. ලදුපත්වල විශේෂාංග

අ. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු **මිලදී ගැනීම හා හුවමාරු කිරීම සඳහා පමණක්** අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - **ඇමුණුම (III)**හි විශේෂයෙන් දක්වා ඇති තොරතුරු ලදුපතෙහි අඩංගු විය යුතු ය.

ආ. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු **විකිණීමට** අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - **ඇමුණුම (IV)**හි විශේෂයෙන් දක්වා ඇති තොරතුරු ලදුපතෙහි අඩංගු විය යුතු ය.

iv. ලදුපතෙහි සියලුම ක්ෂේත්‍රවලට දත්ත ඇතුළත් කළ යුතු ය.

v. ස්වයංක්‍රීය පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේදී සහ ගනුදෙනු පරීක්ෂා කර නිවැරදි බවට තහවුරු කිරීමේදී ද්විත්ව පාලනයක් (පුද්ගලයන් දෙදෙනකු සම්බන්ධවීමේ අවශ්‍යතාව) පවත්වා ගැනීමට අවශ්‍ය වේ. ලදුපත ගනුදෙනුකරු වෙත නිකුත් කිරීමට ප්‍රථම බලයලත් නිලධාරියා විසින් සියලු ගනුදෙනු පරීක්ෂා කර නිවැරැදි බවට තහවුරු කළ යුතු ය.

vi. ලදුපත් කියවිය හැකි පරිදි පැහැදිලි විය යුතු අතර පිටපත් දෙකක් මුද්‍රණය කළ යුතු ය. මුල් පිටපත ගනුදෙනුකරු වෙත නිකුත් කළ යුතු අතර දෙවන පිටපත සමාගම සතුව තබා ගත යුතු ය. නිකුත් කරන ලද ලදුපත්වල වාර්තා ලබා ගැනීමේ පහසුකම ස්වයංක්‍රීය පද්ධතිය තුළ පැවතිය යුතු ය.

4.5 **මිලදී ගැනුම් හා විකිණීමේ ලේඛනය**

i. **මිලදී ගැනුම් ලේඛනය - ඇමුණුම (V)**හි දී ඇති ආදර්ශය අනුව මිලදී ගැනුම් ලේඛනය ජනනය කළ හැකි වන පරිදි සියලුම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම්වලට

අදාළ ගනුදෙනු, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ස්වයංක්‍රිය පද්ධතිය තුළ සටහන් කළ යුතු ය.

ii. **විකිණීමේ ලේඛනය** - (ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා පමණි) - **ඇමුණුම (VI)**හි දී ඇති ආදර්ශය අනුව විකිණීමේ ලේඛනය ජනනය කළ හැකි වන පරිදි ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව සියලුම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීම්වලට අදාළ ගනුදෙනු, ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කළ යුතු ය.

iii. මුදල් හුවමාරුකරන්නන්ගේ බලයලත් නිලධාරියාගේ හඳුනාගැනීමේ විස්තර පැහැදිලිව ලේඛනය තුළ දැක්විය යුතු ය.

iv. සෑම ව්‍යාපාරික ස්ථානයකම වෙන වෙනම ලේඛන පවත්වාගත යුතු ය.

4.6 **"අංක 1 ආකෘති පත්‍රය" පිරවීම හා තබාගැනීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන නිරන්තර විමර්ශන කටයුතුවලට පහසුවන පරිදි පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ද සහිතව බලයලත් ව්‍යාපාරික ස්ථාන තුළ ඉහත පරිච්ඡේද 3.5හි දක්වා ඇති පරිදි අංක 1 ආකෘති පත්‍ර, මුදල් හුවමාරුකරන්නා විසින් ව්‍යාපාරික ස්ථානය තුල තබාගත යුතු ය.

4.7 **ශේෂ ප්‍රකාශන**

i. සිදුකරන ලද ගනුදෙනු, දෛනිකව සහ මාසිකව සාරාංශ කරමින් ස්වයංක්‍රීය පද්ධතිය මඟින් සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම ශේෂ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි විය යුතු ය.

ii. ශේෂ ප්‍රකාශනයේ විශේෂාංග

අ. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු **මිලදී ගැනීම හා හුවමාරු කිරීම සඳහා පමණක්** අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - **ඇමුණුම (VII)**හි දී ඇති ආකෘතියට අනුව මුදල් හුවමාරුකරන්නන්ගේ ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශේෂ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි විය යුතුය.

ආ. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු **විකිණීමට** අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - **ඇමුණුම (VIII)**හි දී ඇති ආකෘතියට අනුව මුදල් හුවමාරුකරන්නන්ගේ ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශේෂ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි විය යුතුය.

4.8 විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නම් කරන ලද වෙනත් ඕනෑම නිලධාරියෙකු හට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විටෙක ලදුපත්, මිලදී ගැනුම් ලේඛනය, විකුණුම් ලේඛනය සහ ශේෂ ප්‍රකාශන ඉදිරිපත් කිරීමට මුදල් හුවමාරුකරන්නන්ට හැකි විය යුතුය.

4.9 විදේශ විනිමය පනතේ 9(5) වගන්තිය හා 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව මුදල් හුවමාරුකරන්නා විසින් ව්‍යවස්ථාපිත වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු ය.

**5. වාර්තා කිරීමේ අවශ්‍යතාවන්**

5.1 **දෛනික විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්**

සෑම ව්‍යාපාරික ස්ථානයකම සිදුකරන ලද දෛනික විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාලගත වාර්තා කිරීමේ පද්ධතිය හරහා **අදාළ දිනය තුළ** වෙන වෙනම විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

5.2 **දෛනික විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්**

ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම ව්‍යාපාරික ස්ථානයකම සිදු කරන ලද දෛනික විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාලගත වාර්තා කිරීමේ පද්ධතිය හරහා **අදාළ දිනය තුළ** වෙන වෙනම විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

5.3 **තැන්පතුවල මාසික ප්‍රකාශනය**

i. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල මාසික ප්‍රකාශන, ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ජනනය කළ යුතු ය.

ii. **ඇමුණුම (IX)**හි දී ඇති ආකෘතියට අනුව සියලුම ව්‍යාපාරික ස්ථාන සඳහා වෙන වෙනම පිළියෙල කරන ලද සහ අදාළ බලයලත් වෙළෙන්දන් විසින් තහවුරු කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැම්පතුවලට අදාළ, මාසික ප්‍රකාශනවල දෘඩ පිටපත් ඊළඟ මාසයේ **10වන දින හෝ ඊට පෙර** විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතු ය. තවද, මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම එහි Microsoft Excel පිටපත dfem@cbsl.lk විද්‍යුත් තැපැල වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

5.4 2005 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ පනත (සංශෝධිත පරිදි ) හෝ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව සමාගම විසින් සියලුම සැක කටයුතු ගනුදෙනු, අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය, 14 වන මහල, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, යන ලිපිනයට වාර්තා කළ යුතු ය.

5.5 සමාගමේ විගණනය කරන ලද ගිණුම්, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ සිට **මාස හය(06)ක්** ඇතුළත විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය.

**6. අනාවරණය කිරීම්**

6.1 සමාගම විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන දෛනික විනිමය අනුපාතික, සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම කැපී පෙනෙන ස්ථානයක

ප්‍රදර්ශනය කළ යුතු ය.

6.2 සමාගමේ සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම අවසරපත්‍රය කැපී පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු අතර විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය පරිදි අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කළ යුතු ය.

6.3 සමාගම විසින් අවසරපත්‍ර අංකය සහිත නාම පුවරුව සහ **ඇමුණුම (X)**හි පෙන්වා ඇති ලාංඡනය (60cm x 60cm) පුවරුවක් මත අඟල් 10ක අරයක් සහිතව සුදු පසුබිමක රතු පැහැයෙන් [Pantone 187C (100%)] **ඇමුණුම (X)**හි පෙන්වා ඇති අන්‍යෝන්‍ය ප්‍රමාණවලට සැහෙන තරම් අනුරූප වන පරිදි, අදාල ව්‍යාපාරික ස්ථානය මුදල් හුවමාරු කිරීම සඳහා බලයලත් ස්ථානයක් බවට මහජනතාවට දැනුම් දෙමින් සෑම ව්‍යාපාරික ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතු ය.

**7. මෙම විධානයන්හි කාර්යය සඳහා අර්ථකථන:**

**(අ) "බලයලත් ව්‍යාපාරික ස්ථාන"** යන්නෙහි අදහස;

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 16 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) වගන්තිය ප්‍රකාරව විදේශ විනිමය වෙළඳාම් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවසර ලබා දී ඇති පරිසීමිත වෙළෙන්දන්ගේ ව්‍යාපාරික ස්ථාන.

**(ආ) "බලයලත් වෙළෙන්දා"** යන්නෙහි අදහස;

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 33 වන වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙන්දා.

**(ඇ) "බලයලත් පුද්ගලයා"** යන්නෙහි අදහස;

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 4 වන වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා

**(ඈ) "බලයලත් නිලධාරියා"** යන්නෙහි අදහස;

බලයලත් ව්‍යාපාරික ස්ථානයන්හි සිදුකරන විදේශ විනිමය ගනුදෙනු පරීක්ෂාකර නිවැරදි බවට තහවුරු කිරීම සඳහා පරිසීමිත වෙළෙන්දා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයා.

**(ඉ) "බලයලත් අත්සන"** යන්නෙහි අදහස;

මෙම විධානයන්හි සඳහන් ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළෙන්දා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයාගේ අත්සන.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2020 දෙසැම්බර් 15**

**විදේශ සංචාර වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන:**

| | සංචාරයෙහි අරමුණ | අවශ්‍ය ලිපිලේඛන |
|---|---|---|
| 1 | නිවාඩු සහ වන්දනා ගමන් | i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; සහ<br>ii. නැවත පැමිණීම සඳහා ගුවන් ටිකට්පතක්. |
| 2 | ව්‍යාපාරික අරමුණු | i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; සහ<br>ii. අධ්‍යක්ෂ, හවුල්කරු, තනි අයිතිකරු හෝ සේවායෝජක වශයෙන් අයදුම්කරු ව්‍යාපාර සංවිධානයේ දරන තනතුර තහවුරු කරන ලිපියක්. |
| 3 | රාජකාරී අරමුණු | i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්;<br>ii. රාජකාරී අරමුණක් සඳහා සංචාරය කිරීමට අයදුම්කරුගේ නාම යෝජනාව තහවුරු කරමින් එම අයදුම්කරු සේවයේ නියුතු අමාත්‍යාංශයේ ලේකම් හෝ රජයේ දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියාගෙන් ලිපියක්; සහ<br>iii. අයදුම්කරුට රටින් පිටවීම සඳහා අදාළ වන පරිදි ජනාධිපතිගේ හෝ අගමැතිගේ අනුමැතිය ලබා දෙන ලිපියක්. |
| 4 | පෞද්ගලික පුහුණු පාඨමාලා | i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්;<br>ii. අයදුම්කරුගේ අර්ථසාධක අරමුදල් අංකය ඇතුළත් කරමින් අයදුම්කරුගේ නාමයෝජනාව තහවුරු කරන අයදුම්කරුගේ සේවායෝජකයාගෙන් ලිපියක්; සහ<br>iii. අයදුම්කරු පුහුණු පාඨමාලාව සඳහා තෝරාගත් බවට පුහුණුව සඳහා සංචාරය කිරීමට නියමිත රටෙහි අදාළ පුහුණු ආයතනය මගින් ලබා දුන් ලිඛිත සාක්ෂි. |
| 5 | ක්‍රීඩා | i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්;<br>ii. අයදුම්කරුගේ නාමයෝජනාව තහවුරු කරමින් අදාළ ක්‍රීඩා ආයතනය මගින් ලබාදුන් ලිපියක් සහ ක්‍රීඩා සඳහා අදාළ අමාත්‍යාංශය මගින් නිර්දේශය ලබාදුන් ලිපියක්;<br>iii. අයදුම්කරු රජයේ නිලධාරියෙකු වන අවස්ථාවක දී අයදුම්කරුට රටින් පිටවීම සඳහා අවසරය ලබා දෙමින් ජනාධිපති හෝ අගමැතිගෙන් ලබාගත් ලිපියක්; සහ<br>iv. අයදුම්කරු ආරක්ෂක බලකායේ හෝ පොලිස් බලකායේ සාමාජිකයෙකු වන අවස්ථාවකදී, ආරක්ෂක කටයුතු සම්බන්ධ අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දෙන ලිපියක්. |
| 6 | සමුළු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු | i. සමුළු, සම්මන්ත්‍රණ හෝ වැඩමුළු පැවැත්වෙන රටෙහි සංචාරය කිරීම සඳහා වීසා බලපත්‍ර අවශ්‍ය වේ නම්, වලංගු වීසා බලපත්‍රයක්;<br>ii. අදාළ රටෙන් අයදුම්කරු වෙත කරන ලද ආරාධනය දැක්වෙන ලිපියක්; සහ<br>iii. අදාළ සමුළුව, සම්මන්ත්‍රණය හෝ වැඩමුළුව සඳහා සහභාගි වීමට සේවායෝජක විසින් කරන ලද අයදුම්කරුගේ නාමයෝජනාව සහිත ලිපියක්; හෝ එවැනි සහභාගිත්වයක් සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාව පෙන්වන ඕනෑම ලියවිල්ලක්. |
| 7 | අධ්‍යාපන (ජීවන වියදම් පමණි) | i. පිළිගත් විදේශීය අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි කර ගැනීමේ සහතිකය සහ අයදුම්කරුගේ වියදම් සම්බන්ධයෙන් එම ආයතනය විසින්ම නිකුත් කළ ලිඛිත සාක්ෂි; සහ<br>ii. ශිෂ්‍ය වීසා බලපත්‍රයක්. |
| 8 | වෛද්‍ය | i. දේශීය විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශයක් සමග රෝහල්, වෛද්‍ය සහ සාත්තු සේවා සම්බන්ධයෙන් පිළිගත් විදේශීය සාත්තු සේවා නිවාසයක්/රෝහලක් මගින් ලබාගත් කුවිතාන්සියක් හෝ ඇස්තමේන්තුවක්; සහ<br>ii. වලංගු වීසා බලපත්‍රයක්. |

**පරිසීමිත වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය විකිණීම** **පෝරමය 1**

| | |
|---|---|
| ජා.හැ/විදේශ ගමන් බලපත්‍ර /සමාගම් ලියාපදිංචි අංකය | |
| ආදායම් බදු ලිපිගොනු අංකය | |
| අයදුම්කරුගේ නම | |
| අයදුම්කරුගේ ලිපිනය | |
| අයදුම්කරු සතු මුදල්වල මූලාශ්‍රය | |
| ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර අංකය (සංචාර සඳහා පමණි) | |
| ප්‍රතිලාභියාගේ නම හා ලිපිනය | |
| අරමුණ | |
| අයදුම් කරන ලද විදේශ විනිමය ප්‍රමාණය | එ.ජ.ඩො |
| | යූරෝ |
| | ස්ටර්ලිං පවුම් |
| | |

මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

………… ……………………..

දිනය අයදුම්කරුගේ අත්සන

| | |
|---|---|
| අනුක්‍රමික අංකය | |
| අවසරපත් අංකය | DFE/RD |
| අරමුණෙහි කේතය | |
| ශාඛාවෙහි නම | |
| උප අරමුණෙහි කේතය | |
| රටෙහි කේතය | |

| | ව්‍යවහාර මුදල් කේතය | මුදාහරින ලද විදේශ විනිමය ප්‍රමාණය |
|---|---|---|
| බැංකු අණකර | | |
| ටෙලිග්‍රැපික් හුවමාරු | | |
| සංචාරක පත | | |
| වෙනත් (විස්තර කරන්න) | | |
| ව්‍යවහාර මුදල් නිකුත් කිරීම | | |

| | | | |
|---|---|---|---|
| පරිසීමිත වෙළෙන්දාගේ භාවිතය සඳහා | ……………<br>දිනය | …………………<br>ටෙලර් යන්ත්‍ර ක්‍රියාකරන්නාගේ අත්සන | …………………..<br>පරිසීමිත වෙළෙන්දාගේ අත්සන සහ මුද්‍රාව |

| | |
|---|---|
| සටහන් | |

සටහන: අයුදුම්කරු ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කරන පුද්ගලයා විය යුතුය. උදාහරණයක් ලෙස: ව්‍යාපාරික සංචාරයක් සඳහා සේවකයෙකුට විදේශ විනිමය සපයන සමාගමක්, අයදුම්කරු විය යුතු අතර, අදාළ සේවකයා ප්‍රතිලාභියා විය යුතුය.

**ශ්‍රී ලංකා රුපියල්වලට හෝ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සිදුකරන අවස්ථාවේදී නිකුත් කළ යුතු ලදුපත**

**බලයලත් ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය සහ දුරකථන අංකය**

අවසරපත්‍ර අංකය: DFE/RD/...……….

අනුක්‍රමික අංකය: ……….................

දිනය: ……......................

ගනුදෙනුකරුගේ නම: ………………………………………….............

ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය: ………………………………………….............

ජාතිය: ………………………………………….............

ලිපිනය: ………………………………………….............

………………………………………….............

| ව්‍යවහාර මුදල් වර්ගය | ලැබුණු විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය | ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය | නිකුත් කරන ලද ප්‍රමාණය (රු./වෙනත් විදේශ ව්‍යවහාර මුදල්) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

…………………….…
ගනුදෙනුකරුගේ අත්සන

………..…………………….…………………....
පරිසීමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව

**ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් විසින් ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීම සිදුකරන අවස්ථාවේදී නිකුත් කළ යුතු ලදුපත**

**බලයලත් ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය සහ දුරකථන අංකය**

අවසරපත්‍ර අංකය: DFE/RD/……….. අනුක්‍රමික අංකය: ………...............

දිනය: ……......................

ගනුදෙනුකරුගේ නම: ……………………………………………............

ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය: ……………………………………………............

ජාතිය: ……………………………………………............

ලිපිනය: ……………………………………………............

……………………………………………............

| ලැබුණු ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය | ව්‍යවහාර මුදල් වර්ගය | ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය | නිකුත් කරන ලද / විකුණන ලද ඇ.එ.ජ.ඩො. හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

……………………… ………..……………………..……………….....

ගනුදෙනුකරුගේ අත්සන පරිසීමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව

# මිලදී ගැනුම් ලේඛනය

| දිනය | ලදුපතෙහි අනුක්‍රමික අංකය | ගනුදෙනුකරුගේ නම | ලිපිනය | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | ජාතිය | විදේශ ව්‍යවහාර මුදල් මූලාශ්‍රය | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීම | | | බලයලත් නිලධාරියාගේ හඳුනා ගැනීමේ තොරතුරු | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | **මිලදී ගත් විදේශ ව්‍යවහාර මාණය ප්‍රමාණය** | **විනිමය අනුපාතය** | **නිකුත් කරන ලද රු./වෙනත් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය** | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

## විකුණුම් ලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
|---|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | දිනය | ගනුදෙනු කරුගේ නම සහ ලිපිනය | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | සංචාරය කිරීමට නියමිත රටවල් | නිකුත් කළ විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය | ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීමේ අනුපාතය | බලයලත් නිලධාරියාගේ හඳුනා ගැනීමේ විස්තර | වෙනත් සටහන් |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

**විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා පමණක් අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා ශේෂ ප්‍රකාශනය**

…….. / …. / ….  **සිට** ……. /…. / ….  **දක්වා ශේෂ ප්‍රකාශනය**

| ව්‍යවහාර මුදල් වර්ගය | **ආරම්භක ශේෂය** | **මුළු විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්** | **වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකට හුවමාරු කිරීම්** | **බලයලත් වෙළෙන්දන් හට විකිණීම්** | **අවසන් ශේෂය** |
|---|---|---|---|---|---|
| ඇ.එ.ජ.ඩො. | | | | | |
| ස්ටර්ලිං පවුම් | | | | | |
| යූරෝ | | | | | |
| වෙනත් විදේශ ව්‍යවහාර මුදල් | | | | | |

සටහන : වෙනත් ව්‍යවහාර විදේශ මුදල් වර්ග සඳහා අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කර ගත හැකිය.

**ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා ශේෂ ප්‍රකාශනය**

…….. / …. / ….  **සිට** ……. /…. / ….  **දක්වා ශේෂ ප්‍රකාශනය**

| ව්‍යවහාර මුදල් වර්ගය | **ආරම්භක ශේෂය** | **මුළු විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්** | **වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකට හුවමාරු කිරීම්** | **බලයලත් වෙළෙන්දන් හට විකිණීම්** | **මහජනතාව වෙත විකිණීම්** | **අවසන් ශේෂය** |
|---|---|---|---|---|---|---|
| ඇ.එ.ජ.ඩො. | | | | | | |
| ස්ටර්ලිං පවුම් | | | | | | |
| යූරෝ | | | | | | |
| වෙනත් විදේශ ව්‍යවහාර මුදල් | | | | | | |

සටහන : වෙනත් ව්‍යවහාර විදේශ මුදල් වර්ග සඳහා අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කර ගත හැකිය.

**විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල මාසික ප්‍රකාශනය**

පරිසීමිත වෙළෙන්දාගේ නම / ශාඛාව:

අවසරපත්‍ර අංකය: DFE RD

වාර්තා කරන වර්ෂය සහ මාසය:

| ව්‍යවහාර මුදල් වර්ගය | මුදල් කේතය | මුළු තැන්පතු |
|---|---|---|
| එක්සත් අරාබි එමීර් ඩිරාම් | AED | |
| ඔස්ට්‍රේලියානු ඩොලර් | AUD | |
| බහරේන් ඩිනාර් | BHD | |
| බෲනායි ඩොලර් | BND | |
| කැනේඩියානු ඩොලර් | CAD | |
| ස්විස් ෆ්‍රෑන්ක් | CHF | |
| චීන යුවාන් (රෙන්මින්බි) | CNY | |
| සයිප්‍රස් පවුම් | CYP | |
| ඩෙන්මාර්ක් ක්‍රෝනර් | DKK | |
| යූරෝ | EUR | |
| ස්ටර්ලිං පවුම් | GBP | |
| හොංකොං ඩොලර් | HKD | |
| ඉන්දුනීසියානු රුපියා | IDR | |
| ජෝර්දාන ඩිනාර් | JOD | |
| ජපන් යෙන් | JPY | |
| කොරියානු වොන් | KRW | |
| කුවේට් ඩිනාර් | KWD | |
| මැලේසියානු රින්ගිට් | MYR | |
| නෝර්වේජියානු ක්‍රෝනර් | NOK | |
| නවසීලන්ත ඩොලර් | NZD | |
| ඕමාන් රියාල් | OMR | |
| පිලිපීන පෙසෝ | PHP | |
| කටාර් රියාල් | QAR | |
| සවුදි අරාබි රියාල් | SAR | |
| ස්කොට්ලන්ත පවුම් | SCP | |
| ස්වීඩන ක්‍රෝනර් | SEK | |
| සිංගප්පූරු ඩොලර් | SGD | |
| තායිලන්ත බාත් | THB | |
| ඇ.එ.ජ. ඩොලර් | USD | |
| දකුණු අප්‍රිකානු රැන්ඩ් | ZAR | |
| ***ඉහත සඳහන් ව්‍යවහාර මුදල් වර්ගවලට අමතරව තවත් මුදල් වර්ග වේ නම්, පේළි දීර්ඝ කර ගත හැකිය.*** | | |

අදාළ ලිපිලේඛන පරීක්ෂා කළ අතර ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

…………………………………………...  …………………………………

පරිමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව  බැංකුවේ අත්සන සහ නිල මුද්‍රාව

…………………….  …………………….

දිනය  දිනය

ශ්‍රී ලංකා මහ බැංකුව ★ இலங்கை மத்திய வங்கி ★ CENTRAL BANK OF SRI LANKA ★

AUTHORISED
MONEY CHANGER